සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටස යටතේ 2010 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචිවූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,806 - 2013 අප්‍රේල් 12 වැනි සිකුරාදා - 2013.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 990 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1002 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1003 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1046 |


*සැ. යු.-* (i) රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) අර්ල් ගුණසේකර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අප්‍රේල් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත්‍රය සම්පූර්ණ කර "ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න" යන ලිපිනයට 2012 අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය(මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|
| 01 | රියදුරු<br>II ආ ශ්‍රේණිය | 02 | PL3-2006A<br>රු. 12,470-10x130-10x145 - 10x160 - 12 x 170 - රු. 18,860 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය සමත් විය යුතු ය.<br><br>වෘත්තීය සුදුසුකම් :<br>1. පෞද්ගලික/කුලීරථ හා අඩු ස්ටේෂන් වැන්රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතු ය.)<br>2. වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතු ය.<br>3. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු ය.<br><br>වෙනත් සුදුසුකම් :<br>1. අවම උස අඩි 5කට වැඩිවිය යුතු ය.<br>2. දිවා කාලයේ හා රාත්‍රී කාලයේ මනා අක්ෂි පෙනීමක් තිබිය යුතු ය. |
| 02 | ක්ෂේත්‍ර කම්කරු | 06 | PL1-2006A<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලක අවම වශයෙන් පහ/හය වැනි ශ්‍රේණිය සමත් විය යුතු ය. |
| 03 | සෞඛ්‍ය කම්කරු | 04 | PL1-2006A<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |
| 04 | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | PL2-2006A<br>රු.12,210-10x130-10x145 - 10x160 - 12 x 170 - රු. 18,600 | 1. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය 9 වසර සමත්වී තිබීම.<br>2. බාහිර අයදුම්කරුවන් සඳහා ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී කුමන හෝ විෂයයන් දෙකකින් සමත්වී තිබීම. |
| 05 | ආදාහනාගාර ක්‍රියාකරු සහයක | 01 | PL1-2006A<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600 | අවම වශයෙන් අට ශ්‍රේණිය/ නවය වසර සමත්වී තිබීම. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය(මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය* |
|---|---|---|---|---|
| 06 | මැෂින් ඔපරේටර් | 02 | PL2-2006A | අවම වශයෙන් දහවන ශ්‍රේණිය සමත්වීම<br>*වෘත්තීය වෙනත් සුදුසුකම් :-*<br>1. තාරබර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් හා මගීන් 32ට වඩා ගෙනයාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය.<br>2. අවම උස අඩි 5යි අඟල් 6ක් විය යුතුය.<br>3. බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාළ (අංක 1 යටතේ සඳහන් ) බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීනතාවයක් ලබා තිබීම.<br>4. මොටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය. |

*2. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
2. අයදුම්කරු/කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකිකයෙක් විය යුතුය.
3. අයදුම්කරු/කාරිය වලල්ලාවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 5ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය.
4. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතුය.
6. රජයේ /පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහ කරනු ලැබූවෙක් හෝ රාජ්‍ය චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය.
7. වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දැනට ආදේශක පදනම මත සේවය කරන සේවකයන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
8. අයදුම්කරුවන් තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

*3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
2. වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය ;
3. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයට යටත් වේ ;
4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද, මුදල් රෙගුලාසිවලටද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලටද, බස්නාහිර පළාත් සභාවේ/බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ/වලල්ලාවිට ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසිවලට හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*4.ඉල්ලුම්කළ යුතු ආකාරය :*

01. මෙම නිවේදනයේ දැක්වෙන ආදර්ශ ආකෘතිය පරිදි (12"x 8" ප්‍රමාණයේ ) අයදුම්පත් සකස්කර, ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2013.04.30 වැනි දිනට පෙර ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

(දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දිනෙන් පසුව ලැබෙන ඉල්ලුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතිකවල පිටපත් අමුණා එවිය යුතු වන අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතිකය ;
3. තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුයි);
5. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික තිබේ නම් එම සහතික (රජයේ/පළාත් පාලන) ;
6. සේවයේ නියුක්තවූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

03. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

*5. බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. අයදුම්කරුවන් අතුරින් නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර පුරප්පාඩු සිදුකරනු ලැබේ.

2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීමේ සියළු බලතල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

එම්. එම්. ඉන්ද්‍රා කාන්ති,
ලේකම්,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

2013 පෙබරවාරි මස 20 වැනි දින,
වලල්ලාවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*වලල්ලාවිට ප්‍රාදේශීය සභාව*

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ...................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. (i) මුලකුරු සමග නම :—————————.
   (ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————.
2. ස්ථිර ලිපිනය :—————————.
   2.1 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————.
3. (i) උපන් දිනය : අවුරුද්ද :—————————, මාසය :—————————, දිනය :—————————.
   (ii) 2013.02.08 දිනට වයස : අවුරුදු :—————————, මාස :—————————, දින :—————————.
4. ස්ත්‍රී /පුරුෂ භාවය :—————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :—————————.
6. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්ද/ එසේනම් පරම්පරායෙන් ද /ලියාපදිංචි වීමෙන් ද යන වග :—————————.
7. අධ්‍යාපන සුදුසුකම් :—————————.
   (සමත්වූ විභාග පිළිබඳ විස්තර)
   .(i) සමත් වූ වසර/ශ්‍රේණිය :—————————.
   (ii) අපො.ස. (සා.පෙළ,) විභාගය :—————————.
   විභාග අංකය :—————————. විභාග වර්ෂය හා මාසය:—————————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

   (iii) අ.පො.ස. (උ.පෙ.) :—————————.

08. ඔබ දැනට ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තරය :—————————.
09. පළපුරුද්ද වෘත්තීය සුදුසුකම් :—————————.
10. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :———.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසුව දැන ගත හොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

—————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන .................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශය කර ඉදිරිපත් කරමි.

—————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————————.
පදවි නාමය :—————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:—————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය :—————————.

04-331

## හම්බන්තොට මහ නගර සභාව

## දකුණු පළාත් රාජ්‍ය සේවය

හම්බන්තොට මහ නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු වලට සුදුසුකම් සපුරා ඇති හම්බන්තොට මහ නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(01) ශ්‍රී ලංකා රියදුරු සේවය 111 පන්තිය

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 1 | රියදුරු | III ප්‍රාථමික ශිල්පීය ශ්‍රේණිය | 07 | PL3-2006A රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 - රු.18,860 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය ඕනෑම විෂයන් 06කින් සමත්වී තිබීම. |

*වෙනත් සුදුසුකම් :*

පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය මත රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් සහ නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. සහ මෝටර් රථ රියදුරන් බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර 03ක පලපුරුද්දක් ලබා තිබිය යුතුය. (පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.)

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීම මගින් අයදුම්පත් කැඳවීමෙන් පසු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් සහ වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ.
(ii) මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියළු පත් කිරීම්/බඳවා ගැනීම් දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආයතනගත මෝටර් රථ රියදුරන් සඳහා වන රියදුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.
(iii) නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සංලක්ෂය :*

දැනට හම්බන්තොට මහ නගර සභාව තුළ ආදේශක/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන අඛණ්ඩ සේවා කාලය වසර 03ක් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් කෙරේ වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ. (මේ බැව් චර්යා සටහන් මගින් සනාථ කළ යුතුය.)

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කාලයක් තුළ හම්බන්තොට මහ නගර සභා සීමාව තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්දහිමි නාමලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. (රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(v) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂාවේදී ශාරීරික වශයෙන් නුසුදුසු බැව් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
(vi) අයදුම්කරු ඒ තනතුර සඳහා දක්වා ඇති අවම සුදුසුකම් සපුරාලිය යුතුය.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) ස්ථිර පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසි වලටද, දකුණු පළාත් සභාව විසින් වරින් වර පනවන ලද රෙගුලාසි වලටද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමියගේ නිර්දේශ වලටද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින් වර පනවනු ලබන වෙනත් නියෝග වලටද පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට සියළු සේවකයන් බැඳී සිටී.

02. *කාර්යාල සේවක සේවයේ II හා III පන්තිය ඃ*

| *අනු අංකය* | *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 2 | කාර්යාල කාර්ය සහායක II | II ශ්‍රේණිය ශිල්පීය නොවන | 04 | PL1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගය එකවරක දී විෂයයන් 06කට නොඅඩුව සම්මාන සාමාර්ථ 02ක් සහිතව සමත්වීම |
| 3 | මාර්ග කම්කරු III | III ශ්‍රේණිය ශිල්පීය නොවන | 16 | PL1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600 | 9 වැනි වසර සමත් වී තිබීම |
| 4 | සෞඛ්‍ය කම්කරු III | III ශ්‍රේණිය ශිල්පීය නොවන | 25 | PL1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600 | 9 වැනි වසර සමත් වී තිබීම |

03. *ශ්‍රේණිගත නොවූ තනතුරු ඃ*

| *අනු අංකය* | *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 5 | යන්ත්‍ර ක්‍රියාකරු | III ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | PL2-2006A රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 -12 x 170 - රු.18,600 | 9 වැනි වසර සමත් වී තිබීම |
| 6 | විදුලි කාර්මික | III ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | PL2-2006A රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 -12 x 170 - රු.18,600 | 9 වන වසර සමත් වී තිබීම |
| 7 | වඩු කාර්මික | III ප්‍රාථමික අර්ධ ශිල්පීය | 01 | PL2-2006A රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 -12 x 170 - රු.18,600 | 9 වන වසර සමත් වී තිබීම |
| 8 | ක්‍රීඩා භූමි භාරකරු | III ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | PL1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600 | 9 වන වසර සමත් වී තිබීම |
| 9 | ගස් කපන්නා | III ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | PL1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600 | 9 වන වසර සමත් වී තිබීම |
| 10 | ගව සාතකාගාර භාරකරු | III ප්‍රාථමික ශිල්පීය නොවන | 01 | PL1-2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600 | 9 වන වසර සමත් වී තිබීම |

*වෙනත් සුදුසුකම් ඃ -*

(i) ඉහත අංක 03 හි අර්ධ ශිල්පීය මට්ටම් තනතුරු වන යන්ත්‍ර ක්‍රියාකරු, විදුලි කාර්මික, වඩු කාර්මික යන තනතුරු (PL2-2006A) සඳහා තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරනු ලබන වෘත්තීය පුහුණුව පිළිබඳ NVQ 1, NVQ 2 හෝ 3 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබාතිබිය යුතුය. නොඑසේ නම් ඒ හා සමාන රජය පිළිගත් වෘත්තීය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

(ii) ඉහත අංක 03 හි අර්ධ ශිල්පීය මට්ටමේ තනතුරු සඳහා තනතුරට අදාළ ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ රජය පිළිගත් වෙනත් ආයතනයක් යටතේ යටත් පිරිසෙයින් වසර දෙකකට වැඩි කාලයක් සේවය කර තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.)

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

*සංලක්ෂය :-*

ඉහත අංක 2-10 දක්වා වූ තනතුරුවල දැනටමත් ආදේශක/අනියම්/කොන්ත්‍රාත් හෝ තාවකාලික පදනම යටතේ හම්බන්තොට මහ නගර සභාවේ සේවය කරනු ලබන සතුටුදායක සේවා කාලයක් සහිත අයදුම්කරුවන් කෙරේ ප්‍රමුඛතාවය දක්වනු ලැබේ. (සතුටුදායක සේවා කාලය සේවා සහතික මගින් සනාථ කළ යුතු ය.)

*බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.
(ii) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
(iii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් නොලද අයෙකු විය යුතු ය.
(v) හම්බන්තොට මහ නගර සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය. (එලෙස ස්ථිර පදිංචිය සනාථ කළ හැකි ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පිහිටි ආසන්නම පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල අයදුම්කරුවන් කෙරේ අවධානය යොමු කරනු ලැබේ.
(vi) අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන කාල සීමාව අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමට හම්බන්තොට මහ නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා ට බලය හිමි වේ.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) අංක 2-10 දක්වා වූ සියලු තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. සුදුසුකම් මත බඳවා ගනු ලබන සේවකයන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
(ii) ස්ථිර පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
(iii) මීට අමතරව ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, දකුණු පළාත් සභාව විසින් වරින් වර පනවන ලද රෙගුලාසිවලට ද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ නියෝගවලට ද, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වරින් වර පනවනු ලබන වෙනත් නියෝග වලට ද පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලු සේවකයන් බැඳී සිටී.

*අයදුම්පත් එවිය යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2013 මැයි මස 03 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "නාගරික කොමසාරිස්, හම්බන්තොට මහ නගර සභාව, හම්බන්තොට" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවර අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් තම ඉල්ලුම්පත්‍ර තම ආයතනික ප්‍රධානියා මගින් එවිය යුතු ය. අයදුම්පත්‍ර ඒ4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර ඉදිරිපත් කළ යුතු ය.) අසම්පූර්ණ අපැහැදිලි හා නියමිත දිනට ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(I) අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල සහතික කරන ලද පිටපත් අමුණා එවිය යුතු ය :

*(අ)* උප්පැන්න සහතිකය,
*(ආ)* විභාග ප්‍රතිඵල සහතිකය,
*(ඇ)* අධ්‍යාපන සහතිකය,
*(ඈ)* පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතු ය.),
*(ඉ)* මෑතක දී ලබා ගත් ග්‍රාම සේවා සහතිකය,
*(ඊ)* මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ,
*(උ)* වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
*(ඌ)* සේවා පළපුරුද්ද පිළිබඳ සහතික,
*(එ)* රියදුරු සඳහා රිය පැදවීම් බලපත්‍රයේ පිටපතක්.

නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහ නගර සභාව,
හම්බන්තොට.

හම්බන්තොට මහා නගර සභා කාර්යාලයේ දී ය.

## ආදර්ශ අයදුම් පත්‍රය

දකුණු පළාත් රාජ්‍ය සේවය - හම්බන්තොට මහ නගර සභාව

................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

1. (අ) මුලකුරු සමග නම :————————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.
2. ස්ථිර ලිපිනය:————————.
3. (අ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————.
   (ආ) ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය:————————.
5. (අ) උපන් දිනය:————————.
   (ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :————————.
6. දුරකථන අංකය :
   (අ) ජංගම :————————.
   (ආ) නිවස :————————.
7. ස්ත්‍රී /පුරුෂ භාවය:————————.
8. විවාහක/අවිවාහකබව:————————.
9. අධ්‍යාපන සුදුසුකම්:—
   (අ) අ.පො.ස. (සා./පෙළ) විභාගය
   විභාග අංකය:————————. වර්ෂය:————————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 01. | | 05. | |
| 02. | | 06. | |
| 03. | | 07. | |
| 04. | | 08. | |

   (ආ) ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර:————————.

10. (අ) වෙනත් අධ්‍යාපන සුදුසුකම්:————————.
    (ආ) වෘත්තීය සුදුසුකම් :————————.
    (ඇ) සේවා පළපුරුද්ද :————————.
11. රියදුරු සේවය සඳහා :—
    (අ) රියදුරු බලපත්‍රයේ වර්ගය :————————.
    (ආ) රියදුරු බලපත්‍රයේ අංකය :————————.
    (ඇ) රියදුරු බලපත්‍රය නිකුත් කළ දිනය :————————.
12. ඔබ දැනටමත් මෙම මහ නගර සභාවේ සේවයේ නියුක්තව සිටී නම්,
    (අ) ඔබ දැනට දරන තනතුර :————————.
    (ආ) ස්ථිර/ආදේශක/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ද යන වග :————————.
    (ඇ) එම තනතුරට පත් වූ දිනය :————————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේ ද ? :————————.
    එසේ නම් තොරතුරු :————————.

14. මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව එම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දි ගෙවීමකින් තොරව සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ෑ*

මෙම ඉල්ලුම්කරු වන...................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ.............................. වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරාගත හොත් ඔහු/ඇය කුමන ආකාරයෙන් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි.

————————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම:————————.
පදවි නාමය:————————.
දෙපාර්තමේන්තුව/ආයතනය (නිල මුද්‍රාව):————————.
දිනය:————————.

04-393

---

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම

කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම උපලේඛනයේ සඳහන් සුදුසුකම් ඇති කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුරු නාමය* | *තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 1. | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය - III පංතිය - සෞඛ්‍ය කම්කරු | 7 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL-1-2006A වැටුප් කේතය රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 | | රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය සමත්වී තිබීම. |
| | | | | 11. | මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |
| 2. | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය - III පංතිය - වැඩ කම්කරු | 13 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL-1-2006A වැටුප් කේතය රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 | | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| | | | | 11. | මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ. |
| 3. | ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය - III පංතිය - මුරකරු | 1 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL-1-2006A වැටුප් කේතය රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 | | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| | | | | 11. | මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

| තනතුරු නාමය | තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| 4. ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවක ගණය III පංතිය - විදුලි කාර්මික | 2 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL- 2-2006A වැටුප් කේතය රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600 | අ) බාහිර අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් :-<br><br>1 පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත්වීම<br><br>11. මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා අනියම් /ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br><br>ආ) දැනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9වසර) සමත්වී තිබිය යුතුය.<br><br>ඇ) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>*ශිල්පීය නිපුනතා* - තනතුරට අදාළව වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳව NVQ 4 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br><br>*පළපුරුද්ද* - තනතුරට අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක හෝ වෙනත් පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට හෝ ඊට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 5. ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය - III පංතිය - සෞඛ්‍ය කම්කරු පරිපාලක | 1 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL1-2006A වැටුප් කේතය රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 | (1) අ. බාහිර අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>(11) මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |

| තනතුරු නාමය | තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| 6. ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය සේවක ගණය - III පංතිය වැඩ පරිපාලක | 1 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL-2-2006A වැටුප් කේතය රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600 | ආ) බාහිර අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br>ආ) දැනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9වසර) සමත්වී තිබිය යුතුය.<br>මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාලවේ.<br>*ශිල්පීය නිපුනතා* - තනතුරට අදාළව වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳව NVQ 2 හෝ 3 මට්ටමේ සහතිකයක් ලබා තිබීම.<br>*පළපුරුද්ද* - තනතුරට අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක හෝ වෙනත් පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 02කට හෝ ඊට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| 7. ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන සේවක ගණය - III පංතිය - කාර්යාල කාර්ය සහායක | 2 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL-1-2006A වැටුප් කේතය රු. 11,730-10x120-10x130-10x145-12x160-රු. 17,600 | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)<br>II. මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. |
| 8. ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය සේවක ගණය III පංතිය රියදුරු | 4 | අංක 06/2006 (IV) දරන රා.ප.ච. PL3 -2006A වැටුප් කේතය රු. 12,470-10x130-10x145-10x160-12x170-රු. 18,860 | අ) බාහිර අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත්වී තිබිය යුතුය.<br>(වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක වතාවක දී විෂයයන් 05ක් වත් සමත්විය යුතුයි.<br>ආ) දැනට කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9වසර) සමත්වී තිබිය යුතුය.<br>II. මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/ කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාලවේ.<br>*ශිල්පීය නිපුනතා* - තාරබර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන හා බර ට්‍රේලර් සහ මගීන් 32 කට වඩා ගෙන යා හැකි බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි. (ඒ පන්තියේ රියදුරු බලපත්‍රයක්)<br>*පළපුරුද්ද* - වාහන රියදුරෙකු වශයෙන් වසර 03 පළපුරුද්දක් තිබිය යුතුය. (සේවාව සහතික මගින් සනාථ කළ යුතුයි.) |

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරුවන් කුරුණෑගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුයි. (වසර 03ක ස්ථිර පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කළ සහතිකයක් මත අදාළ ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර සනාථ කළ යුතුයි.)

(iii) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
මෙම බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක දිනය වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය/ශිල්පීය/ශිල්පීය නොවන තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට ඔවුනට පමණක් පෞද්ගලික වනසේ උපරිම වයස් සීමාව බල නොපායි.

(iv) කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(v) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් සිටිය යුතු අතර දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු ය.

(vi) දැනටමත් පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් ඔහු අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුයි.

(vii) ප්‍රාථමික ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින වන විට එම තනතුර සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වනසේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළවේ.

(viii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරා ගැනේ.

*සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි :*

(i) මෙම තනතුරු ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) වැන්දඹු අනත්දරු පුරුෂ හා අනත්දරු දායකත්වය හිමිවේ.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.

4. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට රජයේ දෙපාර්තමේන්තු නියෝග වලට ද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුවේ.

*අයදුම්පත් සමග ඉදිරිපත් කළ යුතු ලේඛන :*

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගෙන් ලබාගත යුතු ය.)
(v) වෘත්තිය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුක්ත වුවත් නම් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)
මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

*අයදුම් කළ යුතු ආකාරය :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් ඉල්ලුම්කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2013.04.26 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, මල්පිටිය, බෝයගනේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ව බලය කුරුණෑගල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

ඩී. ඩී. වික්‍රමසිංහ,
ලේකම්,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව,
මල්පිටිය,
බෝයගනේ.

2013 මාර්තු මස 25 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

ආදර්ශ අයදුම්පත

**ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය හා ශිල්පීය තනතුරු සඳහා බඳවා ගැනීම - කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

............................................ ***තනතුර සඳහා අයදුම්පත්‍රය***

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————.
2. මුලකුරු සමග නම :——————.
3. ස්ථිර ලිපිනය :——————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
5. උපන් දිනය :
   අවුරුද්ද :——————.මාසය :——————.දිනය :——————.
6. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ඃ
   අවුරුදු :——————.මාස :——————.දින :——————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
8. විවාහක/අවිවාහක බව :——————.
9. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින්ද? උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න (ලියාපදිංචියෙන් නම් විස්තර සපයන්න) :——————.
11. අධ්‍යාපන සුදුසුකම්(සහතිකවල ඡායාපිටපත් ඇමිණිය යුතුයි):——————.

අ.පොස. (සාමාන්‍ය පෙළ)
විභාග අංකය :——————. වර්ෂය :——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

අ.පො.ස. (උසස් පෙළ)
විභාග අංකය :——————. වර්ෂය :——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. වෙනත් අධ්‍යාපන සුදුසුකම්(සහතිකවල ඡායාපිටපත් ඇමිණිය යුතුයි) :——————.

   i. වෘත්තීය සුදුසුකම් (සහතික වල ඡායාපිටපත් ඇමිණිය යුතුයි) :——————.

   ii. පළපුරුද්ද :——————.

      i. වර්තමාන සේවා ස්ථානය :——————.
      ii. වර්තමාන තනතුරු :——————.
      iii. එම තනතුරට පත්වූ දිනය :——————.
      iv. මුල් සේවා ස්ථාන සහ දරන ලද තනතුරු :——————.

13. උසාවියෙන් යම් වරදකට වරදකරු කර තිබේද ? :——————.

*අයදුම්කරුගේ ප්‍රකාශය*

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි හා සත්‍ය බව ප්‍රකාශ කරමි. මෙම කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් හෝ පත්වීම ලැබීමෙන් පසු හෝ නුසුදුසු භාවය ඔප්පු වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් ප්‍රකාශ කර සිටිමි.

——————.
අයදුම්කරුගේ අත්සන

දිනයඃ ——————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................ මයා/මිය/මෙනවිය සේවයට බඳවා ගත් දින සිට ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ලම උපයා ගෙන ඇති බවද, එම කාලසීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු, වාර්තා ආශ්‍රයෙන් නිවැරදි යැයි සොයාගෙන ඇති බව ද, අදාළ *ගැසට්* නිවේදනයන්හි සඳහන් රෙගුලාසි ප්‍රකාර ඔහු/ඇය මා ඉදිරිපිටදී මෙම ඉල්ලුම්පත්‍රය අත්සන් කළ බව ද මෙයින් සහතික කරමි.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.

04-340

---

**සංශෝධනයයි**

**මීරිගම ප්‍රාදේශීය සභාව**

2013.03.28 දිනැති අංක 1,804 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටස පළාත් පාලනය, තනතුරු ඇබෑර්තු යටතේ, බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම මීරිගම ප්‍රාදේශීය සභාව ශීර්ෂය යටතේ පළ කරන ලද නිවේදනයේ,

අංක 08 යටතේ පළකර ඇති "විදුලි කම්බිකරු තනතුරු 02ක් "යන්න "විදුලි කම්කරු තනතුරු 01 ක් " ලෙස ද,

අංක 09 යටතේ පළකර ඇති "මාර්ග කම්කරු තනතුරු 07ක් "යන්න "මාර්ග කම්කරු තනතුරු 08ක් " ලෙස ද, සංශෝධනය විය යුතු ය.

කේ. ඒ. කුමාරසිංහ,
*වැඩ බලන ලේකම්,*
මීරිගම ප්‍රාදේශීය සභාව.

2013 මාර්තු මස 27 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

04-342

---

# පළාත් පාලන නිවේදන

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

**පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

යෝජනා අංක 6(3)

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.7.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද 2011.04.28 අංක 1703/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* IV(අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභාවල අප්‍රසන්න අන්තරාදායක සහ අප්‍රසන්න, හා අන්තරාදායක වෙළඳාම් කටයුතු, සංචාරක වෙළඳාම, ප්‍රාදේශීය සභා සීමා තුළ වාහන නවතා තැබීම, ප්‍රාදේශීය සභා සීමා තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම, ප්‍රාදේශීය සභා සීමා තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම, ලැගුම් නිවාස හා නවාතැන්පලවල් පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ ආණමඩුව ප්‍රාදේශීය සභාව විසින් 2013.01.17 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මාසික රැස්වීමේ තීරණය කර ඇත.

එච්. එම්. උදාර මධුසංඛ පෙරේරා,
සභාපති,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2013 ජනවාරි මස 17 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

04-333

# අතුරු ව්‍යවස්ථා

## මහ නගර සභා

මහ නගර සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මවිසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරිය) 267 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 272 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තියේ (ඌ) ඡේදයෙන් මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට මහනගර සභාවට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා දකුණු පළාතේ මහ නගර සභාවලට බලය පැවරී ඇත.

පළාත් පාලන විෂයය භාර අමාත්‍ය,
දකුණු පළාත.

2012 මැයි මස 21 වැනි දින.

1. මෙම අතුරු ව්‍යවස්ථා මහ නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම හා විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මහ නගර සභා ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් පරිශ්‍රයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් බෝවීම හා වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම හෝ කරවීම හෝ එසේ වීමට ඉඩ හැරීම හෝ නොකළ යුතු ය.

3. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා මහ නගර සභා බල ප්‍රදේශයේ සෑම පරිශ්‍රයකම පදිංචිකරු -

(i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කටු, පොල් කෝම්බ සහ ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා භාජන ආදිය ඉවත් කිරීමට හෝ විනාශ කර දැමීමට හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

(ii) නේවාසික හෝ නේවාසික නොවන ගොඩනැගිලිවල වැහි පිහිලි, ජලය පහතට වැටෙන පයිප්ප සහ ගෙවතුවල ඇති කාණුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු ය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතු ය.

(iii) නේවාසික හෝ නේවාසික නොවන පරිශ්‍ර තුළ ඇති සියලුම ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්ත්වයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාම ද ඒවා මදුරුවන්ගෙන් හා කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීම හෝ ආවරණය කර තැබීම ද ඒවායේ මදුරුවන් හා කෘමීන් බෝවීම වැළැක්වෙන තත්ත්වයකින් තබා ගැනීම ද මදුරුවන් හා කෘමි සතුන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කිරීම ද කළ යුතු ය.

(iv) පරිශ්‍රය තුළ ඇති සියලුම ළිං යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැළැස්විය යුතු ය.

(v) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘත්‍රිම පොකුණක් වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස්කොට පවිත්‍ර කළ යුතු ය.

(vi) ගෙවතුවල හා ඉඩම්වල ඇති කාණුවලින් බැසයන ජලය එකතුවීමෙන් දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතු ය.

(vii) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළෑටි හැර අනෙකුත් සියලුම ලඳු කැලෑ, වගා සහ වෘක්ෂලතාදිය මනුෂ්‍ය වාසස්ථානයන් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කරනු ලැබිය යුතු ය.

*(viii)* සියලුම ගල් වලවල්, මැණික් ගැරු වලවල්, මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ ජලය එකතුවීම වළක්වන ආකාරයට පවත්වාගෙන යා යුතු ය.

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැළෑටි, දිය පරඬැල්, පෙදපාසි, තෙල්පාසි, බරවා පාසි ඇතුළත් ජලජ පැළෑටි හා මදුරුවන් හා කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දැන ගන්නට ලැබෙන වෙනත් යම් පැළෑටියක් හෝ පැළෑටි ඉවත්කොට විනාශ කර දැමිය යුතු අතර, එකී පැළෑටි යම් දිය මාර්ගයක් දිගේ පාවීයාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරීයාම වළක්වාලිය යුතු ය.

(x) වැසිකිලි, දියවලවල්, දිය උරන වලවල්, මුද්‍රා තැබූ වලවල් හා ඒවායේ වටපිටාව ද ඇතුළුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිලි මදුරුවන් බෝවීම වළක්වන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය.

(xi) සුසාන භූමි හෝ වෙනත් පරිශ්‍රයයන්හි මළවුන් සඳහා ඉදිකෙරෙන සිහිවටන ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කළ යුතු ය.

4. මහ නගර සභාවේ නගරාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් හෝ ඕනෑම දිනයක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා ඇතුළත යම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ පරිශ්‍රය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේ ය :

(i) ඒ පරිශ්‍රය මදුරුවන් හා කෘමීන් බෝවන පරිශ්‍රයක් ද යන වග ;
(ii) ඒ පරිශ්‍රයේ පදිංචිකරු මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැද තිබේ ද යන වග ;
(iii) ඒ පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීමට අවශ්‍ය වේ නම්, එම පියවර කවරේ ද යන වග ; සහ
(iv) ඒ පරිශ්‍රයේ කෘමිනාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද යන වග.

5. (i) නගරාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සළකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළ යුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් ඒ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදය යටතේ දැන්වීමක් බාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතු ය.

6. (i) නගරාධිපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු, එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුර එක්රැස් විය හැකි හෝ වතුර රඳවා තබන වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම නොකළ යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදයේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, නගරාධිපතිවරයා විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළදී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ ව්‍යුහය නියම කරනු ලබන ද්‍රව්‍යයකින් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කර දමන ලෙස නැතහොත් ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකි ය.

7. (i) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ වූ දැන්වීමක් යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට පෞද්ගලිකව භාරදීම හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකි ය.

(ii) යම් පරිශ්‍රයක හවුල් අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින්, හවුලේ අධිවසනය කරන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7(i) වැනි අතුරු ව්‍යවස්ථාව සහ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටු කිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන්ව වගකිව යුතු ය.

(iii) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිසියම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් ඉටු කිරීම පැහැර හරින ලද අවස්ථාවක, නගරාධිපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්ය සඳහා නගරාධිපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා අතර වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී පරිශ්‍රයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට සැළැස්වීම කරනු ලැබිය හැකි ය.

(iv) යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් කර ඇති යම් කාර්යයක් හෝ කාර්යයන් නගරාධිපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටු කළ විට ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා මහ නගර සභාවට දරන්නට සිදු වූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් මහ නගර සභාව වෙත ගෙවිය යුතු ය. නගරාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුළත ඒ මුදල එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් මහ නගර සභාවට ගෙවනු ලැබිය යුතු අතර නිශ්චිත කාලය තුළ එකී මුදල ගෙවනු නොලැබුවහොත් මහ නගර සභා ආඥාපනතේ XV වැනි කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මහ නගර සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල —

"අයිතිකරු" යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙක් ද යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද,

"පදිංචිකරු" යන්නෙන් යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නා වූ හෝ තවත් අයෙකු නියෝජිතයකු වශයෙන් හෝ එහි භාරකාරත්වය කළමනාකරණය හෝ පාලනය තැනැත්තෙකු ද,

"පරිශ්‍රය" යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අත්හැර දමන ලද ළිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අත්හැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක, ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් නගරාධිපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු ද,

"රෝග කාරක කෘමීන්" යන්නෙන් මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ.

"නගරාධිපති" යන්නෙන් අදාළ මහ නගර සභාවේ නගරාධිපතිවරයා ද,

"සභාව" යන්නෙන්............. මහ නගර සභාව ද, අදහස් වේ.

04-88/1

---

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා

මහ නගර සභා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් මවිසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මහ නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරිය) 267 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 129 වගන්තිය සහ 272 වැනි වගන්තියේ 5 වැනි උප වගන්තියේ (ආ) ඡේදයෙන් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට මහනගර සභාවට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා දකුණු පළාතේ මහ නගර සභාවලට බලය පැවරී ඇත.

පළාත් පාලන විෂයය භාර අමාත්‍ය,
දකුණු පළාත.

2012 මැයි මස 21 වැනි දින.

**සාමාන්‍ය**

1. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

2. නාගරික සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩාකිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. මහනගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය.

4. මහනගර සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන්කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එසේ කරවිය යුත්තේ ය.

5. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ/ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

   (ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩාකිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ එක් රැස් කරනු ලැබීම පිණිස හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරු වී, කැඩී හෝ එකදිගට තෙතමනයට නිරාවරණයවීම නිසා මොළොක්වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් අපේක්ෂා කරන්නේ නම් සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් සහනාධාරයක් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම සහනාධාරයක් වශයෙන් හෝ එවැනි බහාලුම් සභාවෙන් සැපයිය හැකිය.

(iv) I උප වගන්තියේ විධිවිධානවල සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ සහා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ ක්‍රමයට හා කාල සටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් බැහැර කළ යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේ ය.

6. (i) කිසිම තැනැත්තෙක්, වීථියකට, පාරකට, මංමාවතකට, පටුමාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජලමාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් මහනගර සභා ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට/ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය.

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි,
*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු "කොම්පෝස්ට් බඳුන්" සඳහා කොමසාරිස්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේ නම් කොමසාරිස්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින්ම හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සපයනු ඇත.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන 'ගෙවතු අපද්‍රව්‍ය' හැකිතාක් දුරට කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක්, හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත මහනගර සභාවේ භාරකරුට භාරදිය යුත්තේය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ/ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු, වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය.

(vii) කිසිම තැනැත්තෙක් මහා නගර සභා ප්‍රදේශය තුළ කුණු වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අළුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ/ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේය.

**නිවාස පරිශ්‍රයන්**

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය :-

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මළුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන මහනගර සභා ප්‍රදේශය සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස්වරයා වෙත ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) සෑම හිමිකරුවෙකුට ම හෝ පදිංචිකරුවෙකුට ම (i) ඡේදයේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු/ඇය (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාළ අපද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය. නැතිනම් සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදිකරනු ලැබ ඇති බක්කිවල හෝ එවැනි අපද්‍රව්‍ය සඳහා සභාව විසින් සපයනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුත්තේ ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු, කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව තුන් වර්ගයක බඳුන් හෝ බහාලුම් සැපයිය යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේ ය.

(iii) (i) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක දී කොමසාරිස්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට කොමසාරිස්වරයාට බලය ඇත්තේය. කොමසාරිස්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ i වන උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස්කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

10. (i) සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා කොමසාරිස් විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවෙසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ/ඇයගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කර ඔහුගේ/ඇයගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසරදීමට කොමසාරිස්වරයාට බලය ඇත්තේය.

**සාප්පු සහ කාර්යාල**

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුට සහ පදිංචිකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග සහ (ii) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ගයක් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස්වරයාට ගෙවීම මත අදාළ වන පරිදි හිමිකරු හෝ පදිංචිකරු විසින් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදෙනු ලැබිය යුත්තේය.

(vii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේය.

(viii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"කාර්යාලය" යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

"පදිංචිකරු" යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

"සාප්පුව" යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළදාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

## හෝටල්

12. (i) යම් හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේය.

- *(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
- *(ආ)* ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
- *(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
- *(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iii) සෑම හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක්, මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළුවීම වළකමින් සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් හිමිකරු හෝ පදිංචිකරු විසින් කොමසාරිස්ට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස හෝටලය යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මද්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

## එළවළු සහ පළතුරු වෙළඳසැල්

13. (i) සෑම එළවළු හෝ පළතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

- *(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් අපද්‍රව්‍ය,
- *(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
- *(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
- *(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මේ අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උප වගන්තියේ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද සමඟ සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස්වරයාට ගෙවීම මත නාගරික එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස එළවළු හා පළතුරු වෙළඳසැල යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

## මස්, මාළු, කුකුළුමස් හෝ බිත්තර වෙළඳ කුටි

14. (i) තත් කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේ දී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හැරුණුවිට වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු ඝාතනය නොකළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම ඝාතනය කරනු ලැබිය හැකි සතාගේ හෝ පක්ෂියාගේ වර්ගය, ඝාතකාගාරය ඉදිකරනු ලැබිය යුතු ආකාරය, පිරිසිදු කිරීමට හා මිනිස් පරිභෝජනයට නොගන්නා ලේ, අතුණු බහන් හා වෙනත් කොටස් ඉවත් කිරීමට අදාළ කොන්දේසි සහ සභාව යෝග්‍යයයි කල්පනා කරන වෙනත් කොන්දේසි විශේෂයෙන් සඳහන් කළ යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස්වරයා විසින් අයකරනු ඇති අතර, එම ගාස්තුව බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේදී ගෙවිය යුතුවේ.

(iv) මස්, කකුළු මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(v) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක තැබිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුළත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගයද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත දුර්ගන්ධය පැතිර යාමට පෙර නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මස්, මාළු, කුකුළු මස් හෝ බිත්තර වෙළඳකුටිය යන්නෙන් අදහස් කෙරෙන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්යය සඳහා ගබඩාකර ඇති හෝ අලෙවිය සඳහා තබා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

**පදික වෙළඳාම**

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක්, කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයක නොදැමිය යුත්තේය.

(ii) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේය.

(iii) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තාවූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගද සමග නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ නොතැබිය යුත්තේය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට පෙර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "පදික වෙළෙන්දා" යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නාවූ හෝ තැනැත්තෙකි.

### කර්මාන්තශාලා

16. (i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් කොමසාරිස්වරයාට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස "කර්මාන්තශාලාව" යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම අදාළ වන්නේය.

### කැනීම, ඉදිකිරීම සහ කඩා දැමීම

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබ පරිදි ගාස්තුවක් කොමසාරිස්වරයාට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ;

"මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැනීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු" යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

"අපද්‍රව්‍ය" යන්නට ඉදිකිරීමේදී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේදී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

18. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින යම් තැනැත්තෙක් කොමසාරිස්වරයාගෙන් ලිඛිතව පූර්ව අනුමැතිය ලබාගත යුත්තේය.

(ii) ඉහත (i) වැනි උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙර කොමසාරිස්වරයා විසින් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදා ඇති වැඩපිළිවෙළ, යෝජිත කාර්යය නිමවීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත් කිරීම අතපසු කරයි නම් එය ඉවත් කිරීමට අවශ්‍ය වන පිරිවැය ද සැලකිල්ලට ගත යුත්තේය. අනුමැතිය ලබාදීමට පෙර ඉල්ලුම්කරු ඇස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක් තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේය.

(iii) යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර එහි ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම (ii) වැනි උපවගන්තිය යටතේ තැන්පත් කරනු ලබන මුදල්වලට හිලව් කරනු ලැබේ.

### ආරෝග්‍යශාලා

19. (i) ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය. :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* මෙම උප වගන්තියේ (ඇ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ගය හැර වෙනත් අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උප වගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේය. (i) වැනි උප වගන්තිය යටතේ (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේය.

(iii) (i) වැනි උප වගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස :-

"ආරෝග්‍යශාලාව" යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදාගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුවද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්. වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

"උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය" යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදනය වන සුළු හා අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

### වෙනත් පරිශ්‍රයන්

20. (i) අංක 8 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික සමාජයීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා සභාවට දැනුම්දිය යුත්තේය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ (i) වැනි උප වගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගයද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

### වීථි සහ පොදු ස්ථාන

21. (i) කොමසාරිස්වරයා විසින් නගරාධිපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේය :-

(අ) මහනගර සභා ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසුදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම.

(ආ) වීථි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සපයා සවිකිරීම හා නඩත්තු කිරීම.

(ඇ) උත්සවවලදී, විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවලදී සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම.

(ඈ) නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක්වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙතමනය වාණිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේය.

**මහානගර සභාවේ යුතුකම්**

22. (i) කොමසාරිස්වරයා විසින් නගරාධිපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේය. :-

(අ) අපද්‍රව්‍ය අඩුකිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම;

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම;

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම;

(ඈ) අපද්‍රව්‍ය අඩුකිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරිගැන්වීම් පිරිනැමීම;

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම;

(ඊ) නාගරිකයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්රැස් කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ කාර්ය සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්ය සටහනට ඇතුළත් කිරීම;

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම;

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ කොමසාරිස්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම;

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙළක්ද ඇතුළත්ව නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන, වෙන් කරන ලද, අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය කොමසාරිස්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඔ) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියළුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම;

(ඕ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම;

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරුකිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුටම සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම;

(ග) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නාවූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩය ආරම්භ කරන අදියරේදී හා නිමවීමේදී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම;

(ජ) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙළ කිරීම;

(ට) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම, එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම;

(ඩ) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දාහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

### අවසර පත්‍ර

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නාවූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීවවායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නාවූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇතඃ-

(අ) සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර නාගරික ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම;

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම;

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම;

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම;

(ඉ) අදාල ව්‍යාපාරය මහානගර සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙකදී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් කොමසාරිස්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේදී හෝ පිරියම් කිරීමේදී අවශේෂ වන්නාවූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟවීම;

(ii) සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රය ලැබී දින 30ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේය ;

(iii) කොමසාරිස්වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේය;

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවකදී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේය.

(v) (iv) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවකදී කිසි තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවකදී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස කොමසාරිස්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේය.

### අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

24. සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවත ලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව කොමසාරිස්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් මහානගර සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

### වෙනත්

26. (i) කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හිදී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් කොමසාරිස්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කොමසාරිස්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

27. සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ අනුව, මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මහානගර සභා ආඥාපනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

### අර්ථ නිරූපණය

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස —

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන්, ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, විථි ශුද්ධ කිරීමේදී එකතුවන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ;

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුළු මස්, බිත්තර, එළවළු, පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ;

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ;

"එක්රැස් කිරීම" යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ;

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකළ හැකි හියුමස් ද්‍රව්‍යයකි;

"ලේකම්" යන්නෙන් නාගරිකයන් සම්බන්ධයෙන් වන විට මහානගර සභා ආඥාපනත (255 අධිකාරය) යටතේ එම නාගරිකය සඳහා සංස්ථාපනය කරන ලද නගර සභාවේ කොමසාරිස්වරයා අදහස් කෙරෙන අතර, එම මහනගර සභාවේ කොමසාරිස්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ මහානගර සභා ආඥාපනත යටතේ කොමසාරිස්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණය ඊට ඇතුළත් වේ;

"ගබඩා කිරීම" යන්නෙන් හිමිකරුවකුගේ හෝ පදිංචිකරුවෙකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ;
"ගාස්තුව" යන්නෙන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ;

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් ඉවත් කෙරෙන ශාඛ කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ;

"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ;

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දොළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතුගඟක්, ජලමාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ;

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජන නිෂ්පාදනයන් කිරීමට යොදාගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ;

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් සේදීමෙන් විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ;

"ප්‍රවාහනය" යන්නෙන් මිනිස්, සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබ ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් කෙරේ;

"බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ;

"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට කොමසාරිස්වරයාගෙන් අවසර පත්‍රයක් ලබාගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ ;

"බලයලත් නිලධාරී" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට කොමසාරිස්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ;

"බැහැරලීම" යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දාවූත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරන ලද්දාවූත්, පිරියම් නොකරන ලද්දාවූත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ;

"මාරු කරන ස්ථානය" යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර, ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරු කිරීම එහිදී සිදු කෙරේ;

"තැනැත්තා" යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් අදහස් කෙරේ;

"නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටුකිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ;

"වෙන් කිරීම" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ;

"සැකසීම" යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ;

"සභාව" යන්නෙන් ................. මහ නගර සභාව අදහස් කෙරේ ;

"නාගරික ප්‍රදේශය" යන්නෙන් මහානගර සභා ආඥාපනතේ (252 අධිකාරය) බලය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහසේ කෙරේ;

"සනීපාරක්ෂක බිම් පිරවුම" යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුළියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු.

## නගර සභා

### මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා

### නගරසභා බල ප්‍රදේශ තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ම විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නගර නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරිය) 153 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 157 වැනි වගන්තියේ 9 වන උප වගන්තියේ (ණ) ඡේදයෙන් මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට නගර සභාවට බලය පැවරී ඇති අතර, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා දකුණු පළාතේ මහ නගර සභාවලට බලය පැවරී ඇත.

පළාත් පාලන විෂයභාර අමාත්‍ය,<br>
දකුණු පළාත.

2012 මැයි මස 21 වැනි දින.

1. මෙම අතුරු ව්‍යවස්ථා නගර සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම හා විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. නගර සභා ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් කිසියම් පරිශ්‍රයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් බෝවීම හා වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම හෝ කරවීම හෝ එසේවීමට ඉඩ හැරීම හෝ නොකළ යුතු ය.

3. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා නගර සභා බල ප්‍රදේශයේ සෑම පරිශ්‍රයකම පදිංචිකරු -

   (i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කටු, පොල් කෝම්බ සහ ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා භාජන ආදිය ඉවත් කිරීමට හෝ විනාශ කර දැමීමට හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

   (ii) නේවාසික හෝ නේවාසික නොවන ගොඩනැගිලිවල වැහි පීහිලි, ජලය පහතට වැටෙන පයිප්ප සහ ගෙවතුවල ඇති කානුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු ය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතු ය.

   (iii) නේවාසික හෝ නේවාසික නොවන පරිශ්‍ර තුළ ඇති සියලුම ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්ත්වයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාම ද ඒවා මදුරුවන්ගෙන් හා කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීම හෝ ආවරණය කර තැබීම ද ඒවායේ මදුරුවන් හා කෘමීන් බෝවීම වැළැක්වෙන තත්ත්වයකින් තබා ගැනීම ද මදුරුවන් හෝ කෘමි සතුන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කිරීම ද කළ යුතු ය.

   (iv) පරිශ්‍රය තුළ ඇති සියලුම ළිං යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැළැස්විය යුතු ය.

   (v) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘත්‍රිම පොකුණක් වේ නම්, එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස්කොට පවිත්‍ර කළ යුතු ය.

   (vi) ගෙවතුවල හා ඉඩම්වල ඇති කාණුවලින් බැසයන ජලය එකතුවීමෙන් දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතු ය.

   (vii) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළැටි හැර අනෙකුත් සියලුම ලඳු කැලෑ, වගා සහ වෘක්ෂලතාදිය මනුෂ්‍ය වාසස්ථානයන් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කරනු ලැබිය යුතු ය.

   (viii) සියලුම ගල් වලවල්, මැණික් ගැරු වලවල්, මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ ජලය එකතුවීම වළක්වන ආකාරයට පවත්වාගෙන යා යුතු ය.

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැළෑටි, දිය පරඬැල්, පෙඳපාසි, තෙල්පාසි, බරවා පාසි ඇතුළත් ජලජ පැළෑටි හා මදුරුවන් හා කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දැන ගන්නට ලැබෙන වෙනත් යම් පැළෑටියක් හෝ පැළෑටි ඉවත්කොට විනාශකර දැමිය යුතු අතර, එකී පැළෑටි යම් දිය මාර්ගයක් දිගේ පාවීයාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරීයාම වළක්වාලිය යුතු ය.

(x) වැසිකිළි, දියවලවල්, දිය උරන වලවල්, මුද්‍රා තැබූ වලවල් හා ඒවායේ වටපිටාව ද ඇතුළුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිළි මදුරුවන් බෝවීම වළක්වන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය.

(xi) සුසාන භූමි හෝ වෙනත් පරිශ්‍රයයන්හි මලවුන් සඳහා ඉදිකෙරෙන සිහිවටන ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කළ යුතු ය.

4. නගර සභාවේ සභාපතිවරා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් හෝ ඕනෑම දිනයක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා ඇතුළත යම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතිකකර ගැනීම පිණිස ඒ පරිශ්‍රය පරීක්ෂාකර බැලීම නීත්‍යානුකූල වන්නේ ය :

(i) ඒ පරිශ්‍රය මදුරුවන් හා කෘමීන් බෝවන පරිශ්‍රයක් ද යන වග ;
(ii) ඒ පරිශ්‍රයේ පදිංචිකරු මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැද තිබේ ද යන වග ;
(iii) ඒ පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීමට අවශ්‍ය වේ නම්, එම පියවර කවරේ ද යන වග ; සහ
(iv) ඒ පරිශ්‍රයේ කෘමිනාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද යන වග.

5. (i) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සළකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝගකාරක කෘමීන් විනාශ කිරීමට හා වර්ධනය වීම මැඩ පැවැත්වීමට ඉටු කළ යුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් ඒ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදය යටතේ දැන්වීමක් බාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතු ය.

6 . (i) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු, එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුර එක්රැස් විය හැකි හෝ වතුර රඳවා තබන වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම නොකළ යුතු ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදයේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළදී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ ව්‍යුහය නියම කරනු ලබන ද්‍රව්‍යයකින් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශකර දමන ලෙස නැතහොත් ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකි ය.

7. (i) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ වූ දැන්වීමක් යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට පෞද්ගලිකව භාරදීම හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකි ය.

(ii) යම් පරිශ්‍රයක හවුල් අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින්, හවුලේ අධිවසනය කරන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7(i) වැනි අතුරු ව්‍යවස්ථාව සහ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටු කිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන්ව වගකිව යුතු ය.

(iii) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිසියම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් ඉටු කිරීම පැහැර හරින ලද අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා අතර වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී පරිශ්‍රයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට සැළැස්වීම කරනු ලැබිය හැකි ය.

(iv) යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් කර ඇති යම් කාර්යයක් හෝ කාර්යයන් සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටු කළ විට ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා නගර සභාවට දරන්නට සිදු වූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් නගර සභාව වෙත ගෙවිය යුතු ය. සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුළත ඒ මුදල එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් නගර සභාවට ගෙවනු ලැබිය යුතු අතර නිශ්චිත කාලය තුළ එකී මුදල ගෙවනු නොලැබුවහොත් නගර සභා ආඥාපනතේ IX වැනි කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් නගර සභා ආඥාපනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"අයිතිකරු" යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙක් ද යම් පරිශ්‍රයක කුලියට හෝ එළදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද,

"පදිංචිකරු" යන්නෙන් යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නාවූ හෝ තවත් අයෙකු නියෝජිතයකු වශයෙන් හෝ එහි භාරකාරත්වය කළමනාකරණය හෝ පාලනය කරන තැනැත්තෙකු ද,

"පරිශ්‍රය" යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක්, පාවිච්චි කරනු ලබන හෝ අත්හැර දමන ලද ලිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අත්හැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු ද,

"රෝගකාරක කෘමීන්" යන්නෙන් මදුරුවන් සහ රෝග බෝකරන වෙනත් කෘමීන් ද,

"සභාපති" යන්නෙන් අදාළ නගර සභාවේ සභාපතිවරයා ද,

"සභාව" යන්නෙන්............ නගර සභාව ද,

අදහස් වේ.

---

04-88/3

**නගර සභා**

සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ම විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 153 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 118 වැනි වගන්තිය සහ 157 වැනි වගන්තියේ 9 වැනි උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදයන්ගෙන් සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට නගර සභාවට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා දකුණු පළාතේ නගර සභාවලට බලය පැවරී ඇත.

පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
දකුණු පළාත.

2012 මැයි මස 21 වැනි දින.

**සාමාන්‍ය**

1. මෙම අතුරු ව්‍යවස්ථා සන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

2. නාගරික සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන් හි, පෞද්ගලික පරිශ්‍රයන් හි, වීථිවල, මංමාවත්වල ජනනය වන සන අපද්‍රව්‍ය වෙන්කිරීම, ගබඩාකිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පරිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්ත්වයෙන් තබා ගත යුත්තේ ය.

4. නගර සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන්කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුත්තේය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එසේ කරවිය යුත්තේ ය.

5. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔහුගේ/ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩාකිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ එක් රැස් කරනු ලැබීම පිණිස හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේය. ඒවා ඉරී, සිදුරු වී, කැඩී හෝ එකදිගට තෙතමනයට නිරාවරණයවීම නිසා මොළොක් වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් අපේක්ෂා කරන්නේ නම් සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් සහනාධාරයක් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම සහනාධාරයක් වශයෙන් හෝ එවැනි බහාලුම් සභාවෙන් සැපයිය හැකිය.

(iv) i වැනි උපවගන්තියේ විධිවිධානවල සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ සහ බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ ක්‍රමයට හා කාල සටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් බැහැර කළ යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේ ය.

6. (i) කිසිම තැනැත්තෙක්, වීථියකට, පාරකට, මංමාවතකට, පටුමාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජලමාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් නගර සභා ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම්, ඔහුට/ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii)හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය :-

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන්හි,
*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම් විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම් විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු "කොම්පෝස්ට් බඳුන්" සඳහා කොමසාරිස්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේ නම් ලේකම් එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින්ම හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සපයනු ඇත.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන 'ගෙවතු අපද්‍රව්‍ය' හැකිතාක් දුරට ලේකම් විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක්, හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේය. එසේත් නැතිනම් සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත නගර සභාවේ භාරකරුට භාරදිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ/ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු, විථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේය.

(vii) කිසිම තැනැත්තෙක් නගර සභා ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට විථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීමට හෝ අළුත්වැඩියා කිරීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ/ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරිනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේය.

**නිවාස පරිශ්‍රයන්**

8. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි (තෝරා) වෙන් කළ යුත්තේය.:-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු, ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන නගර සභා ප්‍රදේශය සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයා වෙත ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම (i) ඡේදයේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු/ඇය *(ඇ)* අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාළ අපද්‍රව්‍ය නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය. නැතිනම් සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදිකරනු ලැබ ඇති බක්කිවල හෝ එවැනි අපද්‍රව්‍ය සඳහා සභාව විසින් සපයනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුත්තේය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු, ලේකම් විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව තුන් වර්ගයක බඳුන් හෝ බහාලුම් සැපයිය යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්ත්වයෙන් නඩත්තු කළ යුත්තේය.

(iii) (i) වැනි උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වැනි උප වගන්තියේ විධිවිධානවලට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක දී ලේකම් විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේය. ලේකම්ගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස්කරන්නෙකුගේ රාජකාරිය වන්නේය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් (ඇ) සහ (ඈ) අයිතමයන් හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද, නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

10. (i) සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා කොමසාරිස් විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවෙසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ/ඇයගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන්කර ඔහුගේ/ඇයගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසරදීමට ලේකම්වරයාට බලය ඇත්තේය.

**සාප්පු සහ කාර්යාල**

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන්කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු , ලේකම් විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුට සහ පදිංචිකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග සහ (ii) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ගයක් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත අදාළ වන පරිදි හිමිකරු හෝ පදිංචිකරු විසින් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදෙනු ලැබිය යුත්තේය.

(vii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම වගකීම වන්නේය.

(viii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,-

"කාර්යාලය" යන්නට, 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වැනි අධිකාරය) දී ඇති අර්ථයම ඇත.

"පදිංචිකරු" යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

"සාප්පුව" යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළදාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් ද ඊට ඇතුළත් වේ.

**හෝටල්**

12. (i) යම් හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේය.

(iii) සෑම හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක්, මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළුවීම වළකමින් සියළුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් හිමිකරු හෝ පදිංචිකරු විසින් ලේකම්ට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස හෝටලය යන්නෙන් නිදන පහසුකම් සහිතව හෝ රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මද්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක්, ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, චන්ද්‍රනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක්ද ඇතුළත් වේ.

**එළවළු සහ පලතුරු වෙළඳසැල්**

13. (i) සෑම එළවළු හෝ පලතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පලතුරු හෝ වෙනත් යම් අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙ අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ () වැනි උපවගන්තියේ (ඈ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත නාගරික එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස එළවළු හා පලතුරු වෙළඳසැල යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පලතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

### මස්, මාළු, කුකුළුමස් හෝ බිත්තර වෙළඳ කුටි

14. (i) තත් කාර්යය සඳහා ලේකම් විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේ දී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හැරුණුවිට වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු ඝාතනය නොකළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම ඝාතනය කරනු ලැබිය හැකි සතාගේ හෝ පක්ෂියාගේ වර්ගය, ඝාතකාගාරය ඉදිකරනු ලැබිය යුතු ආකාරය, පිරිසිදු කිරීමට හා මිනිස් පරිභෝජනයට නොගන්නා ලේ, අතුණු බහන් හා වෙනත් කොටස් ඉවත් කිරීමට අදාළ කොන්දේසි සහ සභාව යෝග්‍යයයි කල්පනා කරන වෙනත් කොන්දේසි විශේෂයෙන් සඳහන් කළ යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම් විසින් අයකරනු ඇති අතර, එම ගාස්තුව බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේ දී ගෙවිය යුතුවේ.

(iv) මස්, කකුළු මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරාවෙන් කළ යුත්තේය. :-

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(v) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක තැබිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ *(අ)* අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුළත තැබිය යුතු අතර, එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ *(අ)* *(ආ)* සහ *(ඇ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වැනි උපවගන්තියේ *(ඇ)* අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගයද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත දුර්ගන්ධය පැතිර යාමට පෙර නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මස්, මාළු, කුකුළු මස් හෝ බිත්තර වෙළඳකුටිය යන්නෙන් අදහස් කෙරෙන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්යය සඳහා ගබඩාකර ඇති හෝ අලෙවිය සඳහා තබා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

### පදික වෙළඳාම

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක්, ලේකම් විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයක නොදැමිය යුත්තේය.

(ii) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේය.

(iii) සෑම පදික වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ *(අ)* අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තා වූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර, අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ *(අ)* හා *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වැනි උපවගන්තියේ *(ඇ)*

අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ නොතැබිය යුත්තේය.

(vi) සෑම පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට පෙර සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "පදික වෙළෙන්දා" යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නා වූ හෝ සේවාවක් සපයන්නා වූ හෝ තැනැත්තෙකි.

**කර්මාන්තශාලා**

16. (i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය :-

*(අ)* ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ *(අ)* හා *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස "කර්මාන්තශාලාව" යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථයම අදාළ වන්නේය.

**කැනීම, ඉදිකිරීම සහ කඩා දැමීම**

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම් විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේය.

(iii) පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස ;

"මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැනීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු" යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

"අපද්‍රව්‍ය" යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නා වූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

18. (i) ගෑස්, විදුලිය, ජලය, දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින යම් තැනැත්තෙක් ලේකම්වරයාගෙන් ලිඛිතව පූර්ව අනුමැතිය ලබාගත යුත්තේය.

(ii) ඉහත (i) වැනි උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙර ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදා ඇති වැඩපිළිවෙළ, යෝජිත කාර්යය නිමවීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත් කිරීම අතපසු කරයි නම් එය ඉවත් කිරීමට අවශ්‍ය වන පිරිවැය ද සැලකිල්ලට ගත යුත්තේය. අනුමැතිය ලබාදීමට පෙර ඉල්ලුම්කරු අස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක් තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේය.

(iii) යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම්, ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම (ii) වැනි උපවගන්තිය යටතේ තැන්පත් කරනු ලබන මුදල්වලට හිලව් කරනු ලැබේ.

**ආරෝග්‍යශාලා**

19. (i) ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේය.:-

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* මෙම උපවගන්තියේ (ඇ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ගය හැර වෙනත් අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වන උපවගන්ති යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. (i) වන උපවගන්ති යටතේ (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහාම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේ ය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(iii) (i) වන උපවගන්තියේ *(අ)* හා *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍යවන්නේ නම් මිස ;

"ආරෝග්‍යශාලාව" යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදාගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර, සාත්තු නිවාසයක්, සායනයක්. වෛද්‍ය මධ්‍යස්ථානයක් මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

"උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය" යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑමස්, ආසාදනය වන සුළු හා අතිශයින්ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

**වෙනත් පරිශ්‍රයන්**

20. (i) අංක 8 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික සමාජයීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා සභාවට දැනුම්දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ (i) වන උප වගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

**වීථි සහ පොදු ස්ථාන**

21. (i) ලේකම් විසින් සභාපති සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය :-

(අ) නගර සභා ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම.

(ආ) වීථි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සපයා සවිකිරීම හා නඩත්තු කිරීම.

(ඇ) උත්සවවලදී, විශේෂ සිදුවීම් අවස්ථාවලදී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවලදී සභාවෙන් තීරණයක් කරන විටකදී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම.

(ඈ) නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක්වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම.

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන්ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක නෛතමනය වාණිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

**නගර සභාවේ යුතුකම්**

22. (i) ලේකම් විසින් සභාපති සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩුකිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම.

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම.

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම.

(ඈ) අපද්‍රව්‍ය අඩුකිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරිගැන්වීම් පිරිනැමීම.

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම.

(ඊ) නාගරිකයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහාවන කොන්දේසි එම කාර්යය සටහනට ඇතුළත් කිරීම.

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම.

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම් විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම.

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙළක් ද ඇතුළත්ව නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එකරැස් කරනු ලබන, වෙන් කරන ලද, අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම් අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම.

(ඔ) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර ලේකම් විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම.

(ඕ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම.

*(ක)* අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරුකිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුට සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම.

*(ග)* නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩය ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු, සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම.

*(ජ)* සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙළ කිරීම.

*(ට)* 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙළ කිරීම හා ක්‍රියාත්මක කිරීම, එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම.

*(ඩ)* (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දාහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

**අවසර පත්‍ර**

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීවවායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇත :

*(අ)* සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර නාගරික ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම.

*(ආ)* 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම.

*(ඇ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම.

*(ඈ)* එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම් විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම.

*(ඉ)* අදාළ ව්‍යාපාරය නගර සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්ට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟවීම.

(ii) සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතිකෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභ කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභ කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රය ලැබී දින 30ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ලේකම් විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) (iv) වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසි තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම් මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේය.

### අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

24. සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවත ලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුත්තේය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්ගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් නගර සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නා වූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේය.

### වෙනත්

26. (i) ලේකම්ට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හි දී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමනාකරු හෝ එහි වාසය කරන්නා වූ හෝ සේවය කරන්නා වූ යම් තැනැත්තෙක් ලේකම්ට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්ට හෝ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේය.

27. සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ අනුව, මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කරන යම් බලයලත් නිලධාරියෙකුට දිරිගැන්වීම් පිරිනමනු ලැබිය හැකිය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් නගර සභා ආඥාපනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේය.

### අර්ථ නිරූපණය

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස :-

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන්, ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්, මාළු, කුකුළු මස්, බිත්තර, එළවළු, පලතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"ප්‍රවාහනය" යන්නෙන් මිනිස්, සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් කෙරේ.

"බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට ලේකම්ගෙන් අවසර පත්‍රයක් ලබාගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

"බලයලත් නිලධාරී" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට ලේකම් විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

"බැහැරලීම" යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දාවූත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරන ලද්දාවූත්, පිරියම් නොකරන ලද්දාවූත් සියළුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"මාරු කරන ස්ථානය" යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරු කිරීම එහි දී සිදු කෙරේ.

"තැනැත්තා" යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් අදහස් කෙරේ.

"නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටුකිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

"වෙන් කිරීම" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

"සැකසීම" යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

"සභාව" යන්නෙන් ................. නගර සභාව අදහස් කෙරේ.

"නාගරික ප්‍රදේශය" යන්නෙන් නගර සභා ආඥාපනත (255 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

"සනීපාරක්ෂක බිම් පිරවුම" යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු.

08-88/4

---

## මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා

### ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ම විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 126 වැනි වගන්තියේ (IX) වැනි උප වගන්තියේ (ච) ඡේදයෙන් මදුරුවන් සහ රෝගකාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභා වලට බලය පැවරී ඇති අතර 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැලඳ ගැනීම සඳහා දකුණු පළාතේ ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇත.

පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
දකුණු පළාත.

2012 මැයි මස 21 වැනි දින.

1. මෙම අතුරු ව්‍යවස්ථා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් බෝවීම වැළැක්වීම හා විනාශ කිරීම මගින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම සඳහා වූ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු කිසියම් පරිශ්‍රයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් බෝවීම හා වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම හෝ කරවීම හෝ එසේ වීමට ඉඩ හැරීම හෝ නොකළ යුතු ය.

3. මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෑම පරිශ්‍රයකම පදිංචිකරු -

(i) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ටයර්, පොල්කටු, පොල් කෝම්බ සහ ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය හා භාජන ආදිය ඉවත් කිරීමට හෝ විනාශ කර දැමීමට හෝ එසේ කිරීමට සැලැස්වීම හෝ කළ යුතු ය.

(ii) නේවාසික හෝ නේවාසික නොවන ගොඩනැගිලිවල වැහි පීහිලි, ජලය පහතට වැටෙන පයිප්ප සහ ගෙවතුවල ඇති කානුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතු ය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතු ය.

(iii) නේවාසික හෝ නේවාසික නොවන පරිශ්‍ර තුළ ඇති සියලුම ජල බඳුන් ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්ත්වයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාම ද ඒවා මදුරුවන්ගෙන් හා කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීම හෝ ආවරණය කර තැබීම ද ඒවායේ මදුරුවන් හා කෘමීන් බෝවීම වැළැක්වෙන තත්ත්වයකින් තබා ගැනීම ද මදුරුවන් හා කෘමි සතුන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කිරීම ද කළ යුතු ය.

(ii) පරිශ්‍රය තුළ ඇති සියලුම ළිං යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්ත්වයෙන් තබා ගැනීමට අවශ්‍ය කටයුතු සැළැස්විය යුතු ය.

(iv) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘත්‍රිම පොකුණක් වේ නම් එය යටත් පිරිසෙයින් සතියකට එක් වරක්වත් හිස්කොට පවිත්‍ර කළ යුතු ය.

(v) ගෙවතුවල හා ඉඩම්වල ඇති කාණුවලින් බැසයන ජලය එකතුවීමෙන් දිය කඩිති සෑදීම වැළැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතු ය.

(vii) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැළැටි හැර අනෙකුත් සියලුම ලඳු කැලෑ, වගා සහ වෘක්ෂලතාදිය මනුෂ්‍ය වාසස්ථානයන් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක සිට මීටර් 5ක් ඇතුළත වූ සෑම කොටසකින් ම ඉවත් කරනු ලැබිය යුතු ය.

(viii) සියලුම ගල් වලවල්, මැණික් ගැරු වලවල්, මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ ජලය එකතුවීම වළක්වන ආකාරයට පවත්වාගෙන යා යුතු ය .

(ix) ජලය රැඳිය හැකි ගොඩබිම වැවෙන විසිතුරු පැළැටි, දිය පරඬැල්, පෙඳපාසි, තෙල්පාසි, බරවා පාසි ඇතුළත් ජලජ පැළැටි හා මදුරුවන් හා කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බව කලින් කල දැන ගන්නට ලැබෙන වෙනත් යම් පැලැටියක් හෝ පැළැටි ඉවත් කොට විනාශ කර දැමිය යුතු අතර, එකී පැලැටි යම් දිය මාර්ගයක් දිගේ පාවීයාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරීයාම වළක්වාලිය යුතු ය.

(x) වැසිකිලි, දියවලවල්, දිය උරන වලවල්, මුද්‍රා තැබූ වලවල් හා ඒවායේ වටපිටාව ද ඇතුලුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිලි මදුරුවන් බෝවීම වළක්වන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය.

(xi) සුසාන භූමි හෝ වෙනත් පරිශ්‍රයන් හි මලවුන් සඳහා ඉදිකෙරෙන, සිහිවටන ජලය නොරැඳෙන අයුරින් ඉදි කිරීමට කටයුතු කළ යුතු ය.

4. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් හෝ ඕනෑම දිනයක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා කාලය ඇතුළත යම් වේලාවක දී යම් පරිශ්‍රයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ පරිශ්‍ර පරීක්ෂා කර බැලීම නිත්‍යානුකූල වන්නේ ය :-

(i) ඒ පරිශ්‍රය මදුරුවන් හා කෘමීන් බෝවන පරිශ්‍රයක් ද වන වග;

(ii) ඒ පරිශ්‍රයේ පදිංචිකරු මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැද තිබේද යන වග;

(iii) ඒ පරිශ්‍රයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීමට අවශ්‍ය වේ නම්, එම පියවර කවරේද යන වග; සහ

(iv) ඒ පරිශ්‍රයේ කෘමි නාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද යන වග.

5. (i) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියකු විසින් යම් පරිශ්‍රයක අවශ්‍ය වේ යැයි සළකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී පරිශ්‍රයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් විනාශ කිරීමට හා වර්ධනයවීම මැඩ පැවැත්වීමට ඉටු කළ යුතු කාර්යයන් ලිඛිත දැන්වීමකින් ඒ පරිශ්‍රයේ අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකි ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදය යටතේ දැන්වීමක් බාරදෙන ලද යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතු ය.

6. (i) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව යම් පරිශ්‍රය අයිතිකරු හෝ පදිංචිකරු එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුර එක්රැස් විය හැකි හෝ වතුර රඳවා තබන වෙනත් ව්‍යුහයක් ඉදිකිරීම හෝ නොකළ යුතු ය .

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි ඡේදයේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ යම් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ කාලයක් තුළ දී එකී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ ව්‍යුහය නියම කරනු ලබන ද්‍රව්‍යයකින් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කර දමන ලෙස නැතහොත්, ඒ කාලය ඇතුළත ඒ දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකිය.

7 (i) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ වූ දැන්වීමක් යම් පරිශ්‍රයක අයිතිකරුට හෝ පදිංචිකරුට පෞද්ගලිකව භාරදීම හෝ එම දැන්වීම එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ භාරදෙනු ලැබිය හැකි ය.

(ii) යම් පරිශ්‍රයක හවුල් අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් හවුලේ අධිවසනය කරන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවෙකු 7 (i) වැනි අතුරු ව්‍යවස්ථාව සහ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයන් ඉටු කිරීම සම්බන්ධ යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන් ව වගකිව යුතු ය.

(iii) 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ කිසියම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ සඳහන් නියමයන් ඉටු කිරීම පැහැර හරින ලද අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 දක්වා අතර වේලාවක අවශ්‍ය විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී පරිශ්‍රයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාර්යයන් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකි ය.

(iv) යම් පරිශ්‍රයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි හෝ 6 වැනි අතුරු ව්‍යවස්ථා යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් කර ඇති යම් කාර්යයක් හෝ කාර්යයන් සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධාරියෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටු කළ විට ඒ කාර්යය හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙහිලා ප්‍රාදේශීය සභාවට දරන්නට සිදු වූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු ය. සභාපතිවරයා විසින් සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14ක් ඇතුළත ඒ මුදල එකී අයිතිකරු හෝ පදිංචිකරු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු අතර නිශ්චිත කාලය තුළ එකී මුදල ගෙවනු නොලැබුවහොත් ප්‍රාදේශීය සභා පනතේ VIII වැනි කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය .

8. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල -

"අයිතිකරු" යන්නෙන්, යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙක් ද යම් පරිශ්‍රයක කුලියට හෝ එලදාවට කවර හෝ ආකාරයක අයිතියකට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද ;

"පදිංචිකරු" යන්නෙන්, යම් පරිශ්‍රයක පදිංචිව සිටින්නාවූ හෝ තවත් අයෙකු නියෝජිතයකු වශයෙන් හෝ එහි භාරකාරත්වය කළමනාකරණය හෝ පාලනය තැනැත්තෙකු ද ;

"පරිශ්‍රය" යන්නෙන්, යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදි කිරීමක් පාවිච්චි කරනු ලබන හෝ අත්හැර දමන ලද ළිඳක්, නැවක්, කන්ටේනරයක් හෝ අත්හැර දමන ලද වාහනයක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක, ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය ද ;

"බලයලත් නිලධාරියා" යන්නෙන්, සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු ද ;

"රෝග කාරක කෘමීන්" යන්නෙන්, මදුරුවන් සහ රෝග බෝ කරන වෙනත් කෘමීන් අදහස් වේ.

"සභාපති" යන්නෙන්, අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද;

"සභාව" යන්නෙන් .................................. ප්‍රාදේශීය සභාව ද;
අදහස් වේ.

04-88/5

---

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා**

ප්‍රාදේශීය සභා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ, පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ම විසින් සම්පාදනය කරනු ලැබූ, පහත දැක්වෙන කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 93 වැනි වගන්තිය සහ 126 වැනි වගන්තියේ 9 වැනි උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේදවලින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා පැනවීමට ප්‍රාදේශීය සභා වලට බලය පැවරී ඇති අතර, 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ ප්‍රකාර, මෙම සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගෙන වැළඳ ගැනීම සඳහා දකුණු පළාතේ ප්‍රාදේශීය සභාවලට බලය පැවරී ඇත.

පළාත් පාලන විෂය භාර අමාත්‍ය,
දකුණු පළාත.

2012 මැයි මස 21 වැනි දින.

සාමාන්‍ය

1. මෙම අතුරු ව්‍යවස්ථා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා ලෙස සඳහන් කරනු ලැබේ.

2. ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, විථිවල, මංමාවත්වල ජනනය වන ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය අපද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්වයෙන් තබාගත යුත්තේය.

4. ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නාවූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එසේ කරවිය යුත්තේ ය.

5. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම ඔහුගේ/ඇයගේ පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝන අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම මෙම අතුරු ව්‍යවස්ථාවේ පූර්වගාමී උප වගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩාකිරීම හෝ මුදාහැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ එක්රැස් කරනු ලැබීම පිණිස හොඳ තත්ත්වයෙන් නඩත්තු කරනු ලැබිය යුත්තේ ය. ඒවා ඉරී, සිදුරු කැඩී හෝ එකදිගට තෙතමනයට නිරාවරණය වීම නිසා මොළොක්වී හෝ වෙන යම් හේතුවක් නිසා සාධාරණ ලෙස පරිහරණය කරන විට කඩා වැටීමට හෝ බිඳී යාමට හැකි තත්ත්වයේ තිබේ නම් එක්රැස් කරනු ලැබීම පිණිස භාවිතා නොකළ යුත්තේ ය. හිමිකරුවන් හෝ පදිංචිකරුවන් අපේක්ෂා කරන්නේ නම් සභාව විසින් ගනු ලබන තීරණයක් අනුව කොටසක් සහනාධාරයක් වශයෙන් හෝ සම්පූර්ණයෙන් ම සහනාධාරයක් වශයෙන් හෝ එවැනි බහාලුම් සභාවෙන් ම සැපයිය හැකි ය.

(iv) I උප වගන්තියේ විධිවිධානවල සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කළින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමයට හා කාල සටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් බැහැර කළ යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්ත්වයට හානිකර හෝ අන්තරායකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැරලීම නොකළ යුත්තේ ය.

6. (i) කිසිම තැනැත්තෙක්, වීථියකට, පාරකට , මංමාවතකට, පටුමාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජලමාර්ගයකට හෝ ජලාශයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකර වන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක්, මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබාගැනීමට සිදුවන අවස්ථාවක දී එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට/ඇයට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

7. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය :

*(අ)* සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කර ඇති ප්‍රදේශයන් හි ;

*(ආ)* සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග.

(ii) පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියට අනුකූලව ඉදිකරනු ලැබ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැලලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු "කොම්පෝස්ට් බඳුන්" සඳහා ලේකම්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේනම් ලේකම්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින් ම හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සපයනු ඇත.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන "ගෙවතු අපද්‍රව්‍ය" හැකිතාක් දුරට ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට සැකසීම හෝ පිරියම් කිරීම හෝ කළ යුත්තේ ය. එම හිමිකරු හෝ පදිංචිකරු ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යයක් වේනම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගෙවීමක් මත ප්‍රාදේශීය සභාවේ භාරකරුට භාරදිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක් ම ඔහුගේ/ඇයගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේ ය. එසේ මළපහ කරනු ලැබුවහොත් අංක 8 සිට 20 දක්වා වන අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවෙසක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරීමට අයැදුම් කරන යම් කෙනෙක් ඔහුගේ/ඇයගේ පරිශ්‍රයේ ජනනය වන ඝන අපද්‍රව්‍ය හා මුදාහරනු ලබන ද්‍රව්‍ය, පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ විස්තර ඔහුගේ/ඇයගේ අයැදුම් පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

**නිවාස පරිශ්‍රයන්**

8. (i) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
*(ඈ)* සතුන්ගේ මළකුණු ශරීර කොටස් සහ අසූචි ;
*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙන ම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේ ය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයෙන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේ ය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයා වෙත ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම (i) ඡේදයේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස්කරන්නෙකුට භාරදිය හැකිය. හිමිකරු හෝ පදිංචිකරු එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් ඔහු/ඇය *(ඇ)* අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග අදාළ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය. නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් එක් එක් අපද්‍රව්‍ය වර්ගය සඳහා ඉදිකරනු ලැබ ඇති බක්කිවල හෝ එවැනි අපද්‍රව්‍ය සඳහා සභාව විසින් සපයනු ලැබ ඇති බක්කිවල හෝ බහාලුම්වල හෝ තැන්පත් කළ යුත්තේ ය.

9. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.:-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතා කරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි ,
*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක අයිතිකරු හෝ පදිංචිකරු, සභාපතිවරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට හා පිරිවිතරයන්ට අනුකූලව තුන් වර්ගයක බඳුන් හෝ බහාලුම් සැපයිය යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයෙන් නඩත්තු කළ යුත්තේ ය.

(iii) (i) වැනි උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක දී ලේකම්වරයා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය. ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියාකිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ i වන උප වගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ රාජකාරිය වන්නේ ය . එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් *(ඇ)* සහ *(ඈ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

10. (i) ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නිත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවෙසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ/ඇයගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ/ඇයගේ වාසස්ථානයට ආසන්නවම සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය .

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ (ii) වැනි උපවගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට අවසරදීමට ලේකම්වරයාට බලය ඇත්තේ ය.

**සාප්පු සහ කාර්යාල**

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක් ම හෝ පදිංචිකරුවෙක් ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ පදිංචිකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එකරැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් හා මහල් බිම් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ පදිංචිකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ තැන්පත් කිරීම සඳහා එක් එක් සාප්පුව හෝ කාර්යාලය සඳහා අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් අවශ්‍ය සංඛ්‍යාව සැපයිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙන ම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුට සහ පදිංචිකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග සහ (ii) වැනි උපවගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ගයක් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් සභාපතිවරයාට ගෙවීම මත අදාළ වන පරිදි හිමිකරු හෝ පදිංචිකරු විසින් ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට බාරදෙනු ලැබිය යුත්තේ ය.

(vii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටලුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේ ම වගකීම වන්නේ ය.

(viii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"කාර්යාලය" යන්නට 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වන අධිකාරිය) දී ඇති අර්ථයම ඇත.

"පදිංචිකරු" යන්නෙන් අදහස් කෙරෙන්නේ සාප්පුවක හිමිකරු හෝ පදිංචිකරු හෝ ව්‍යාපාරයක හෝ කාර්යාලයක භාරකරුය.

"සාප්පුව" යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර, ආහාරපාන අලෙවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක්ද ඊට ඇතුළත් වේ.

### හෝටල්

12. (i) යම් හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජීර්ණනීය අපද්‍රව්‍ය ;
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය ;
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය ;
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හෝටල්කරුවෙක් ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක් හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළුවීම වළකමින් සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යොදා නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ *(අ)* සහ *(ආ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තිය යටතේ භාරදෙනු නොලැබූ එවැනි යම් අපද්‍රව්‍යයක් සහ (i) වැනි උප වගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග, අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභාව

විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් හිමිකරු හෝ පදිංචිකරු විසින් ලේකම්ට ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස හෝටලය යන්නෙන් නිදන පහසුකම් සහිතව හා රහිතව මුදල් ගෙවීම මත පරිභෝජනය සඳහා ආහාරපාන හා මද්‍යසාර සපයනු ලබන ස්ථානයක් අදහස් කෙරේ. එයට ආපනශාලාවක් ආගන්තුක නිවාසයක්, ලැගුම්හලක්, තානායමක්, වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක්, බත් කඩයක් හෝ හෝටලයකට සමාන ආකාරයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන යම් වෙනත් පරිශ්‍රයක් ද ඇතුළත් වේ.

**එළවළු සහ පළතුරු වෙළඳසැල්**

13. (1) සෑම එළවළු හෝ පලතුරු වෙළඳසැලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම පරිශ්‍රයේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් යම් අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රව්‍යකාරී අපද්‍රව්‍ය ,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ *(අ)* අයිතමයෙහි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර, එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තියේ *(අ)*, *(ආ)* සහ *(ඇ)* අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ *(ඇ)* අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස එළවළු හා පළතුරු වෙළඳසැල යන්නෙන් අදහස් කරන්නේ එළවළු හා පළතුරු ගබඩා කර ඇති හෝ විකිණීමට තබා ඇති ස්ථානයකි.

**මස්, මාළු, කුකුළුමස් හෝ බිත්තර වෙළඳ කුටි**

14. (i) තත් කාර්යය සඳහා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේ දී කිසිම තැනැත්තෙක් ගෝඝාතන ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හෝ පක්ෂීන් හැරුණුවිට වෙනත් කිසිම සතෙකු හෝ පක්ෂියෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක ම ඝාතනය කරනු ලැබිය හැකි සතාගේ හෝ පක්ෂියාගේ වර්ගය, ඝාතකාගාරය ඉදිකරනු ලැබිය යුතු ආකාරය, පිරිසිදු කිරීමට හා මිනිස් පරිභෝජනයට නොගන්නා ලේ, අතුණු බහන් හා වෙනත් කොටස් ඉවත් කිරීමට අදාළ කොන්දේසි සහ ප්‍රාදේශීය සභාව යෝග්‍යයයි කල්පනා කරන වෙනත් කොන්දේසි විශේෂයෙන් සඳහන් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා කලින් කලට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයා විසින් අයකරනු ඇති අතර, එම ගාස්තුව බලපත්‍රය නිකුත් කරනු ලබන අවස්ථාවේ දී ගෙවිය යුතු වේ.

(iv) මස්, කුකුල් මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය :-

*(අ)* මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ බිත්තර,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(v) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක තැබිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුළත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(vi) මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උප වගන්තියේ (අ) (ආ) සහ (ඇ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසරලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ (iv) වන උපවගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත දුර්ගන්ධය පැතිරයාමට පෙර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මස්, මාළු කුකුළු මස් හෝ බිත්තර වෙළඳකුටිය යන්නෙන් අදහස් කෙරෙන්නේ මෙම ද්‍රව්‍ය අලෙවි කිරීමේ කාර්යය සඳහා ගබඩාකර ඇති හෝ අලෙවිය සඳහා තබා හෝ නිරාවරණය කර හෝ ඇති ස්ථානයකි.

### පදික වෙළඳාම

15\. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් කරගෙන යන පදික වෙළෙන්දෙක් ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහාමාර්ගයේ හෝ පොදු ස්ථානයක නොදැමිය යුත්තේ ය.

(ii) පදික වෙළෙන්දෙක් වාහනවල හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික වෙළෙන්දෙක් ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය .

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන ම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ (ii) වන උප වගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇත්තාවූ කෘමීන්, මීයන් හෝ සතුන් විසින් කා දමනු ලැබිය හැක්කාවූ අපද්‍රව්‍ය ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික වෙළෙන්දෙක් ම මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වන උප වගන්තියේ (අ) හා (ආ) අයිතමයන් හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ මෙම අතුරු ව්‍යවස්ථාවේ (iii) වන උප වගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ද සමග නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට දෛනිකව භාරදිය යුත්තේ ය. ව්‍යාපාරය පවත්වාගෙන යනු නොලබන අවස්ථාවේ අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් පදික වේදිකාවක පාර අයිනේ හෝ මහා මාර්ගයේ නොතැබිය යුත්තේ ය.

(vi) සෑම පදික වෙළෙන්දෙක් ම අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට පෙර ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "පදික වෙළෙන්දා" යන්නෙන් අදහස් කෙරෙන්නේ පදික වේදිකාවේ හෝ පාර අයිනේ භාණ්ඩ විකුණන්නාවූ හෝ සේවාවක් සපයන්නාවූ හෝ තැනැත්තෙකි.

### කර්මාන්තශාලා

16\. (i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක් ම හෝ නිෂ්පාදකයෙක් ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කාසු කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය සහ ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,

*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. එසේ භාරදෙනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක් රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) 1980 අංක 17 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස "කර්මාන්තශාලා" යන්නට 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනතේ තිබෙන අර්ථය ම අදාළ වන්නේ ය.

**කැනීම, ඉදිකිරීම සහ කඩා දැමීම**

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක් ම එමගින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වන උප වගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iii) පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කැනීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු " යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

"අපද්‍රව්‍ය" යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නාවූ පස්, මඩ, දූවිලි හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නා වූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

18. (i) ගෑස් විදුලිය, ජලය දුරකථන පහසුකම් හෝ වෙනත් පොදු පහසුකම් සැපයීම සඳහා යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කනින යම් තැනැත්තෙක් ලේකම්වරයාගෙන් ලිඛිතව පූර්ව අනුමැතිය ලබාගත යුත්තේ ය.

(ii) ඉහත (1) වන උපවගන්තිය යටතේ අනුමැතිය දීමට පෙර ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් යොදා ඇති වැඩපිළිවෙල, යෝජිත කාර්යය නිමවීමෙන් පසු පාරේ හෝ පොදු ස්ථානයක තාවකාලිකව තැබීමට සිදුවිය හැකි අපද්‍රව්‍ය ප්‍රමාණය සහ ඉල්ලුම්කරු එකී අපද්‍රව්‍ය ඉවත්කිරීම අතපසු කරයි නම් එය ඉවත් කිරමට අවශ්‍ය වන පිරිවැය ද සැලකිල්ලට ගත යුත්තේ ය. අනුමැතිය ලබාදීමට පෙර ඉල්ලුම්කරු ඇස්තමේන්තුගත පිරිවැයට සමාන වූ මුදලක් තැන්පතුවක් වශයෙන් ගෙවීම අවශ්‍ය වන්නේ ය.

(iii) යම් තැනැත්තෙකු අපද්‍රව්‍ය මුළු ප්‍රමාණයම හෝ එයින් කොටසක් හෝ ඉවත් කිරීමට අපොහොසත් වේ නම් හෝ ඉවත් කිරීම අතපසු කරයි නම් ලේකම්වරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට එකී අපද්‍රව්‍ය ප්‍රමාණය ඉවත් කරනු ලැබිය යුතු අතර එහි ප්‍රතිඵලයක් ලෙස දැරීමට සිදුවන වියදම (ii) වන උප වගන්තිය යටතේ තැන්පත් කරනු ලබන මුදල්වලට හිලව් කරනු ලැබේ.

**ආරෝග්‍යශාලා**

19. (i) ආරෝග්‍යශාලාවක හිමිකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.
*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* මෙම උප වගන්තියේ (ඈ) අයිතමයේ සඳහන් අපද්‍රව්‍ය වර්ගය හැර වෙනත් අපද්‍රව්‍ය,
*(ඈ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඉ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වන උප වගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත්කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුත්තේ ය. (i) වන උප වගන්ති යටතේ (ඇ) සහ (ඈ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඒ සඳහා ම විශේෂයෙන් සාදන ලද බඳුනක හෝ බහාලුමක තැන්පත් කළ යුතු අතර ඒ සඳහා වෙන් කරනු ලැබූ ස්ථානයක තැබිය යුත්තේ ය. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ එම ආරෝග්‍යශාලාවට නිකුත් කරනු ලැබූ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව එම අපද්‍රව්‍ය ඉවත් කළ යුත්තේ ය.

(iii) (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන් හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"ආරෝග්‍යශාලාව" යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙළෙන තැනැත්තන් හෝ සතුන් පිළිගැනීම ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන හෝ යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරනු ලැබුව ද) වන අතර සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක් මාතෘ නිවාසයක් සහ සත්ත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

"උපද්‍රවකාරී ආරක්ෂණ අපද්‍රව්‍ය " යන්නෙන් අදහස් කෙරෙන්නේ සායනික අපද්‍රව්‍ය ශරීර කොටස්, වැදෑමස්, ආසාදනය වන සුළු හා අතිශයින් ම ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටු ය.

### වෙනත් පරිශ්‍රයන්

20. (i) අංක 8 සිට 19 දක්වා වන අතුරු ව්‍යවස්ථාවන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සමාජයීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකමක් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

*(අ)* ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
*(ආ)* ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
*(ඇ)* උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
*(ඈ)* පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) (i) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන කෙනෙක් එම ක්‍රියාකාරකම නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම් දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට හෝ (1) වන උපවගන්තියේ (ඇ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ගය ද සමග ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

### වීථි සහ පොදු ස්ථාන

21 (i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡා කර සභාවේ අනුමැතියට යටත්ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

*(අ)* ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළඳපොලවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වා ගැනීම,
*(ආ)* වීථි හා මාර්ග දෙපස සහ පොදු ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සපයා සවිකිරීම හා නඩත්තු කිරීම,
*(ඇ)* උත්සව වල දී, විශේෂ සිදුවීම අවස්ථාවල දී හෝ සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම.,

(ඈ) නේවාසික ප්‍රදේශයන්හි සවිකර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වාගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම ;

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශනය කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම.

(ii) සභාව විසින් විශේෂයෙන් ම කුණු රොඩු සඳහා සපයනු ලබන යම් බක්කියක තෙතමනය වානිජමය, ආයතනික, කාර්මික හෝ වෙනත් අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙකු නොකළ යුත්තේ ය.

**ප්‍රාදේශීය සභාවේ යුතුකම්**

22\. (i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡාකර සභාවේ අනුමැතියට යටත් ව පහත දැක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය :-

(අ) අපද්‍රව්‍ය අඩුකිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම;

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන් කිරීම, එක්රැස් කිරීම, ගබඩාකිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම, ;

(ඇ) ප්‍රතිභාවිතාකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම;

(ඈ) අපද්‍රව්‍ය අඩුකිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරිගැන්වීම් පිරිනැමීම;

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ වෙනස් ආකෘති නියාමනය කිරීම;

(ඊ) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන් හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක් කිරීමේ කාර්යය සටහනක් පිළියෙල කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාර්ය සටහනට ඇතුළත් කිරීම;

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙන ම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාර්ය සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම;

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහය කිරීම;

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය, පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීම;

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකිතාක් මුළුමනින් ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙලක් ද ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන, වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාන්විතයන්ගෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම;

(ඔ) මධ්‍යම පරිසර අධිකාරිය සමග සාකච්ඡා කර ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ආකාරයට සියලුම අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම;

(ඕ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත් අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම;

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරුකිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුට සුදුසු ඇඳුම් අත් ආවරණ මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම;

(ග) නිවෙසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සභාවට ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය නිසා ජනනය වන්නාවූ ඝන අපද්‍රව්‍ය බැහැරලන ආකාරය සහ නියමිත වැඩය ආරම්භ කරන අදියරේ දී හා නිමවීමේ දී සක්කගල් ගබඩා කරනු , සකසනු හා බැහැරලනු ලබන ආකාරය පිළිබඳ විස්තර පරීක්ෂා කිරීම හා අනුමත කිරීම ;

(ජ) සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම ;

(ට) 2000 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික උපායමාර්ගය සහ අදාළ නීතියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් එක් ලිත් වර්ෂය ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03ක් ඉදිරියට ආවරණය කරන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම. එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම ;

(ඩ) (අ) සිට (ට) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම් දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම් දින දාහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

### අවසර පත්‍ර

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නාවූ හෝ කොම්පෝස්ට්, ජීවවායු හෝ වෙනත් නිපැයුමක් නිර්මාණය කරන්නාවූ යම් තැනැත්තෙක් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට සභාව විසින් අවසරපත්‍රයක් නිකුත් කරනු ඇත :-

(අ) සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම;

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම ;

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන සැපයීම;

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදු නොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන සැපයීම;

(ඉ) අදාළ ව්‍යාපාරය ප්‍රාදේශීය සභා සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නා වූ හෝ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි සභාවට භාරදීමට එකඟවීම.

(ii) සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කල විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු බලපත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රය ලැබී දින 30ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ලේකම්වරයා විසින් වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ (i) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලැබූ අවසරපත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) (iv) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසි තැනැත්තෙකු අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මාධ්‍ය මගින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

### අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ

24. සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යය සඳහා වෙන් කරන ලද ප්‍රදේශයට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවත ලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත් ව සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් මිස සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

### වෙනත්

26. (i) ලේකම්වරයාට හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හි දී යම් පරිශ්‍රයකට ඇතුළුවීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන්නේදැයි පරීක්ෂා කර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු කළමනාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් ලේකම්වරයාට හෝ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ලේකම්වරයාට හෝ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

27. සභාව විසින් කලින් කලට ගනු ලබන තීරණ අනුව, මෙම අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කරන යම් බලයලත් නිළධාරියෙකුට දිරිගැන්වීම පිරිනමනු ලැබිය හැකිය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා පනත ප්‍රකාර වරදකට වරදකරු වන්නේ ය.

### අර්ථ නිරූපණය

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන්, ඒවා ඉවත දැමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ විථී ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය, දූවිලි පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ ;

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන්, මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි මස්. මාළු, කුකුල් මස්. බිත්තර, එළවලු, පළතුරු සහ වෙනත් ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ ;

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය " යන්නෙන්, මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලි ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ;

"එක් රැස් කිරීම" යන්නෙන්, බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සඳහා ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ;

"කොම්පෝස්ට්" යන්නෙන්, කාබනික අපද්‍රව්‍ය ක්‍ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකළ හැකි හියුමස් ද්‍රව්‍යයකි;

"ලේකම්" යන්නෙන්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා පනත යටතේ එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා අදහස් කෙරෙන අතර එම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත් කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ එකී සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණයට ඊට ඇතුළත් වේ ;

"ගබඩා කිරීම" යන්නෙන්, හිමිකරුවකුගේ හෝ පදිංචිකරුවකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"ගාස්තුව" යන්නෙන්, සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ ;

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන්, ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් ඉවත් කෙරෙන ශාඛ කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස්, ආදිය අදහස් කෙරේ ;

"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන්, ක්ෂුද්‍ර ජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ ;

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක් 'පොදු ඉඩමක් ' මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක් , ඇළක්, දොළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතුගඟක්, ජලමාර්ගයක්, මුහුද, මුහුදු වෙරළ, හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජන නිෂ්පාදනයන් කිරීමට යොදාගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය " යන්නෙන් සේදීමෙන් විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගී කරගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"ප්‍රවාහනය" යන්නෙන් මිනිස් සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙනයාම අදහස් කෙරේ.

"බක්කිය/බඳුන් හෝ වෙනත් බහාලුම්" යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුදා හැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් බක්කියක්, බඳුනක්, උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

"බලයලත් එක්රැස් කරන්නා" යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස්කිරීමට හෝ ලබාගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබාගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

"බලයලත් නිලධාරී" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරී ඉටුකිරීමට හෝ කරගෙන යාමට ලේකම්වරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

"බැහැරලීම " යන්නෙන් ප්‍රතිභාවිතා නොකරන ලද්දාවූත්, ප්‍රතිචක්‍රීකරණය නොකරන ලද්දාවූත්, සැකසුම් නොකරන ලද්දාවූත් පිරියම් නොකරන ලද්දාවූත් සියලුම අපද්‍රව්‍ය ස්ථිරව රැඳවීමට අදහස් කරනු ලබන ඉඩමෙක මතුපිට හෝ ඇතුළත හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"මාරු කරන ස්ථානය " යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණය, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම් කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමභාවය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරු කිරීම එහිදී සිදු කෙරේ.

"තැනැත්තා" යන්නෙන් සංස්ථාගත හෝ සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් අදහස් කෙරේ.

"ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා" යන්නෙන් බක්කිවලින් හෝ බහාලුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටුකිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙකු අදහස් කෙරේ.

"වෙන් කිරීම" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන් ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

"සැකසීම" යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනවත් නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

"සභාව" යන්නෙන් .......................... ප්‍රාදේශීය සභාව අදහස් කෙරේ.

"ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය" යන්නෙන් ප්‍රාදේශීය සභා පනත (252 අධිකාරිය) බලය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

"සනීපාරක්ෂක බිම් පිරවුම" යන්නෙන් ඒ හා ආශ්‍රිත සමාජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

"හිමිකරු හෝ පදිංචිකරු" යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝර්නි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්තශාලාව, වත්ත කළමනාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුලියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු.

04-88/6

# විවිධ දැන්වීම්

## නිවැරදි කිරීමයි

හම්බන්තොට මහ නගර සභාව

2012.12.21 වැනි දින අංක 1790 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටස විවිධ දැන්වීම් යටතේ 2013 වර්ෂය සඳහා බදු දැන්වීම් පනවන ලද නිවේදනයේ පිටු අංක 3069 හි "හම්බන්තොට ප්‍රාදේශීය සභාව හා කසුන් ඇපා සෙනෙවිරත්න, සභාපති, හම්බන්තොට මහ නගර සභාව" ලෙස මුද්‍රණ දෝෂයකින් පළ වී ඇත.

එය "හම්බන්තොට මහ නගර සභාව, කසුන් ඇපා සෙනෙවිරත්න, නාගරික කොමසාරිස්, හම්බන්තොට මහ නගර සභාව " ලෙස නිවැරදි විය යුතු ය.

කසුන් ඇපා සෙනෙවිරත්න,
නාගරික කොමසාරිස්,
හම්බන්තොට මහ නගර සභාව.

2013 මාර්තු මස 27 වැනි දින,
හම්බන්තොට මහ නගර සභා කාර්යාලයේ දී ය.

04-395

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.